# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 470 / 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 17/03/2024 පැය 1230

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමට තැත් කිරීමේ අපරාධයක වෙඩික්කරු ලෙස කටයුතු කල සැකකරුවෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.**

2024.02.13 වන දින මෝදර පොලිස් වසමේ මෝදර වීදිය කොළඹ 15 ප්‍රදේශයේ පිහිටි අවන්හලක ප්‍රධාන දොරටුව අසලදී එම අවන්හලේ කළමණාකරු ලෙස සේවය කල පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනය කිරීමට තැත් කිරීමේ අපරාධය සම්බන්ධයෙන් මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2024.03.16 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ වික්ටෝරියා පාලම ප්‍රදේශයේදී එම අපරාධයේ වෙඩික්කරු ලෙස කටයුතු කල සැකකරු හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 600 ක් සමඟ මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ පරකන්දෙනිය, ඉඹුල්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම අපරාධයට අදාලව මේ වන විට කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මඟින් එක් සැකකරුවෙකු ද, මෝදර පොලිස් ස්ථානය මඟින් සැකකරුවන් තිදෙනෙකු ද අත්අඩංගුවට ගෙන ඇති අතර, සැකකරුවන් අපරාධය සිදු කිරීමට පැමිණි කාර් රථයක් හා අපරාධයෙන් පසු පලා යාමට භාවිතා කල ත්‍රිරෝද රථයක් විමර්ශන නිලධාරීන් විසින් සොයාගෙන ඇත.

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**